## 192 ජේසුනි ඔබ වේ

ජේසුනි ඔබ වේ සුව දෙන්නා
ජේසුනි ඔබ වෙ සනසන්නා
ජේසුනි ඔබ වෙ ගලවන්නා
ජේසුනි ඔබ වෙ  දෙවි උතුමා

සමේරියා ළිඳ ලඟ සිටි ළඳ දැකලා
බොන්නට ඉල්ලුවේ ඔබ නොවෙදෝ
ජීවන ජලයෙන් ඈ පුරවාලා
යන්නට හැරියේ ඔබ නොවෙදෝ

බේබදු සොයුරා පාරේ වැතිරී
මා දෙස බැලුවේ පිහිට පතා
ඔහු හට සහනය දෙන්නට බැරිවුනේ
ඔබ හඳුනන්නේ නැති නිසාදෝ

ජෙරිකො යන මඟ සිටි අඳ මිනිසා
මොර ගා ඉල්ලුවේ ඔබේ කරුණා
නෙත් මත අත ලා ඔහු සුව කරලා
යන්නට හරියේ ඔබ නොවෙදෝ

ජීවිතා ලොකය ලැබුමට කැමතිව
සොයුරා සිටියේ ඇත්ත සොයා
ඔහුගේ කටහඬ ඇසුනේ නෑ මට
ඔබ හඳුනන්නේ නැති නිසාදෝ

ෂිම්යොන් නිවසෙහි පා ලඟ සිටි කත
අඬමින් ඉල්ලුවේ පාප කමා
ප්‍රේමය වැඩියෙන් පෙන්වූ ඈ හට
ගැලවුම දුන්නේ ඔබ නොවෙදෝ